# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1992 අංක 49 දරන
# මහා කොළඹ ආර්ථික කොමිෂන් සභා (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1992 නොවැම්බර් මස 04 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1992 නොවැම්බර් මස 06 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිළ : ශත 60 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

# 1992 අංක 49 දරන මහා කොළඹ ආර්ථික කොමිෂන් සභා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1992 නොවැම්බර් මස 04 වන දින]

එල්. ඩී.—ඕ. 74/92

**ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන මහා කොළඹ ආර්ථික කොමිෂන් සභා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1992 අංක 49 දරන මහා කොළඹ ආර්ථික කොමිෂන් සභා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මෙහි මින් මතු ප්‍රධාන ප්‍රඥප්තිය යනුවෙන් සඳහන් කරනු ලබන ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන මහා කොළඹ ආර්ථික කොමිෂන් සභා පනතේ දීර්ඝ නාමය එහි "මහා කොළඹ ආර්ථික කොමිෂන් සභාව" යන වචන සහ "එකී කොමිෂන් සභාව" යන වචන වෙනුවට පිළිවෙලින් "ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය" සහ "එකී මණ්ඩලය" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන පනතේ දීර්ඝ නාමය සංශෝධනය කිරීම.

3. (1) ප්‍රධාන ප්‍රඥප්තියෙහි සහ වෙනත් යම් ලිඛිත නීතියක මහා කොළඹ ආර්ථික කොමිෂන් සභාව හැඳින්වීම සඳහා යොදනු ලබන "මහා කොළඹ ආර්ථික කොමිෂන් සභාව" යන වචන සහ "කොමිෂන් සභාව" යන වචන වෙනුවට පිළිවෙලින් "ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය" සහ "මණ්ඩලය" යන වචන ආදේශ කරනු ලැබිය යුතු ය. ප්‍රධාන ප්‍රඥප්තියේ සහ ලිඛිත නීතිවලට සංශෝධන.

(2) යම් ඇන්වීමක, ගිවිසුමක, සංනිවේදනයක හෝ වෙනත් යම් ලේඛනයක මහා කොළඹ ආර්ථික කොමිෂන් සභාව හැඳින්වීම සඳහා යෙදී ඇති "මහා කොළඹ ආර්ථික කොමිෂන් සභාව" හෝ "කොමිෂන් සභාව" යන සෑම සඳහන් කිරීමක්ම පිළිවෙලින්, "ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය" සහ "මණ්ඩලය" ගැන කරන ලද සඳහනක් සේ කියවා තේරුම් ගත යුතු ය.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(1) ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු සාමාජිකයන් පස් දෙනකුගෙන් මණ්ඩලය සමන්විත විය යුතු අතර, ඒ සාමාජිකයන්ගෙන් එක්කෙනකු මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් ලෙස ද තවත් සාමාජිකයකු මණ්ඩලයේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ලෙස ද පත් කරනු ලැබිය යුතු ය."; සහ

(2) ඒ වගන්තියේ (7) වන උපවගන්තියේ "අධ්‍යක්ෂ ජනරාල්ට හෝ වෙන යම් සාමාජිකයකුට" යන වචන වෙනුවට "අධ්‍යක්ෂ ජනරාල්ට හෝ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්ට හෝ වෙන යම් සාමාජිකයකුට" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය, එහි (2) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

“ (2) අධ්‍යක්ෂ ජනරාල් මණ්ඩලයේ සියලු රැස්වීම්වල මුලසුන දැරිය යුතු අතර, යම් රැස්වීමක් සඳහා අධ්‍යක්ෂ ජනරාල් පැමිණ නොමැති විටක අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ඒ රැස්වීමේ මුලසුන දැරිය යුතු ය. මණ්ඩලයේ යම් රැස්වීමක් සඳහා අධ්‍යක්ෂ ජනරාල් සහ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් යන දෙදෙනාම පැමිණ නොමැති විටක, පැමිණ සිටින සාමාජිකයන් විසින් තෝරා පත්කර ගනු ලබන යම් සාමාජිකයකු විසින් ඒ රැස්වීමේ මූලසුන දැරිය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය, එහි “ අධ්‍යක්ෂ ජනරාල් ” යන වචන වෙනුවට “ අධ්‍යක්ෂ ජනරාල් හෝ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ” යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 20අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

7. මෙහි පහත දැක්වෙන වගන්තිය 20 වන වගන්තියට ඉක්බිතිව ම ඇතුළත් කරනු ලබන අතර එය 20අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය :—

“ බලපත්‍රලත් ව්‍යවසායයන් සම්බන්ධයෙන් මණ්ඩලයේ බලතල.

20අ. (1) යම් බලපත්‍රලත් ව්‍යවසායක ව්‍යාපාරය සඳහා අවශ්‍ය ගොඩනැගිලි සඳහා සැලසුම් අනුමත කිරීම හෝ ඒ බලපත්‍රලත් ව්‍යවසායේ ව්‍යාපාරය පිහිටුවීම, ආරම්භ කිරීම හෝ කරගෙන යාම සඳහා නියමිත යම් බලපත්‍රයක්, අවසර පත්‍රයක් හෝ අධිකාරයක් නිකුත් කිරීම සම්බන්ධයෙන් යම් ලිඛිත නීතියක් මගින් පැවරී ඇති, පැනවී ඇති හෝ භාර කොට ඇති සියලු බලතල, කාර්ය සහ කර්තව්‍ය, ක්‍රියාවේ යෙදීමට, කිරීමට හෝ ඉටු කිරීමට යම් නීතියකින් බලය පවරා ඇති තැනැත්තා, පුද්ගල මණ්ඩලය හෝ අධිකාරිය ගැන කර තිබෙන සඳහන, මණ්ඩලය ගැන කර තිබෙන සඳහනක් වූවාක් සේ, මණ්ඩලය විසින් යම් බලපත්‍ර ලත් ව්‍යවසායක් සම්බන්ධයෙන්, ඒ බලතල, කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාවේ යෙදීම, කිරීම හෝ ඉටු කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් බලතල, කාර්ය හා කර්තව්‍යවලට අමතරව, බලපත්‍රලත් කලාපයෙන් බාහිරව පිහිටි බලපත්‍රලත් ව්‍යවසාය හා සම්බන්ධව, මෙහි ‘ ඇ ’ හා ‘ ඇ ’ උපලේඛනවල නිශ්චිතව දක්වා ඇති ලිඛිත නීතිවලින් යම් තැනැත්තකුට, පුද්ගල මණ්ඩලයකට හෝ අධිකාරයකට පැවරී ඇති, පැනවී ඇති හෝ හැර කොට ඇති සියලු බලතල, කාර්ය හා කර්තව්‍ය,

ක්‍රියාවේ යෙදීමට, කිරීමට හෝ ඉටු කිරීමට ඒ ලිඛිත නීතියෙන් බලය පවරා තිබෙන තැනැත්තා, පුද්ගල මණ්ඩලය හෝ අධිකාරිය ගැන කර තිබෙන සඳහන, මණ්ඩලය ගැන කර තිබෙන සඳහනක් වූවාක් සේ, මණ්ඩලය විසින් ඒ බලතල, කාර්ය හෝ කර්තව්‍ය ඒ ව්‍යවසාය සම්බන්ධයෙන් ක්‍රියාවේ යෙදිය හැකි ද, කළ හැකිද, ඉටු කළ හැකිද වන්නේ ය:

එසේ වුව ද, ජාතික පාරිසරික පනත යටතේ වූ බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක්, ඒ පනත යටතේ සංස්ථාපනය කර ඇති මධ්‍යම පාරිසරික අධිකාරිය විමසා සහ ඒ අධිකාරියේ එකඟත්වය ඇතිව මිස, මණ්ඩලය විසින් ක්‍රියාවේ යෙදීම, කිරීම හෝ ඉටු කිරීම නොකළ යුතු ය.".

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන වගන්තිය එහි ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 26අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය:— ප්‍රධාන ප්‍රඥප්තියේ 26අ වගන්තිය ඇතුළත් කිරීම.

"යම් වාරණ නියෝගයක් ආදිය නිකුත් කිරීමට පෙර මණ්ඩලයට දැනුම් දිය යුතු බව.

26අ. 1988 අංක 79 දරන පනතින් සංශෝධිත පරිදි වූ සිවිල් නඩු විධාන සංග්‍රහයේ 664 වන වගන්තිය යටතේ යම් වාරණ නියෝගයක්, එනම්,—

(අ) මේ පනතින් මණ්ඩලය වෙත පවරා ඇති, පනවා ඇති හෝ භාර කොට ඇති බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී හෝ ඉටු කිරීමේ දී නැතහොත් සද්භාවයෙන් උද්දේශිත ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී හෝ ඉටු කිරීමේ දී යම් කාරණයක් හෝ දෙයක් කරගෙන යාමෙන් මණ්ඩලය නතර කරන හෝ වලක්වාලන ; හෝ

(ආ) මේ පනතින් මණ්ඩලය වෙත පවරා ඇති, පනවා ඇති හෝ භාර කොට ඇති බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී හෝ ඉටු කිරීමේ දී නැතහොත් සද්භාවයෙන් උද්දේශිත ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී හෝ ඉටු කිරීමේ දී බලපත්‍රලාභී යම් ව්‍යවසායක් විසින් හෝ ප්‍රදේශ ව්‍යවසායක් විසින් කර ගෙන යනු ලැබීමට මණ්ඩලය විසින් බලය දෙනු ලැබූ, බලපත්‍ර දෙනු ලැබූ හෝ අවසර දෙනු ලැබූ යම් කාරණයක් හෝ දෙයක් කරගෙන

යාමෙන් ඒ බලපත්‍රලත් ව්‍යවසාය හෝ ප්‍රදේශ ව්‍යවසාය හෝ එහි අයිතිකරු, හවුල් කරු, අධ්‍යක්ෂ, කළමනාකරු, අනුයෝජිත, නිලධරයකු හෝ සේවකයකු හෝ ඒ බලපත්‍රලත් ව්‍යවසාය හෝ ප්‍රදේශ ව්‍යවසාය සඳහා යම් වැඩක් හෝ සේවයක් ඉටු කරන යම් තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් නතර කරමින් හෝ වළක්වාලමින් ඒ ව්‍යවසායට හෝ ප්‍රදේශ ව්‍යවසායට, එහි අයිතිකරුට, හවුල් කරුට, අධ්‍යක්ෂට, කළමනාකරුට, අනුයෝජිතයාට, නිලධරයාට, සේවකයාට හෝ ඒ තැනැත්තාට හෝ පුද්ගල මණ්ඩලයට

විරුද්ධව වාරණ නියෝගයක් නිකුත් කිරීම, අවස්ථාවෝචිත පරිදි, මණ්ඩලය එකී බලපත්‍රලත් ව්‍යවසාය හෝ ප්‍රදේශ ව්‍යවසාය, අයිතිකරු, හවුල් කරු, අධ්‍යක්ෂ, කළමනාකරු, අනුයෝජිත, නිලධරයා, සේවකයා හෝ ඒ තැනැත්තා හෝ පුද්ගල මණ්ඩලය වෙත දැන්වීම් භාර කොට, අවස්ථාවෝචිත පරිදි, මණ්ඩලයට, ඒ බලපත්‍රලත් ව්‍යවසායට, ප්‍රදේශ ව්‍යවසායට, අයිතිකරුට, හවුල් කරුට, අධ්‍යක්ෂට, කළමනාකරුට, අනුයෝජිතයාට, නිලධරයාට, සේවකයාට හෝ ඒ තැනැත්තාට හෝ පුද්ගල මණ්ඩලයට සවන් දීමෙන් පසුව මිස, නොකළ යුතු ය.".

*වලංගුභාවයට පත් කිරීම.*

9. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වීමට පෙර මණ්ඩලය විසින් අතිරේක අධ්‍යක්ෂ ජනරාල් වෙත පවරා තිබුණු බලතල හෝ කාර්ය කිසිවක් ප්‍රකාර ක්‍රියාත්මක කරන ලද හෝ ඉටු කරන ලද නැතහොත් එසේ ක්‍රියාත්මක කරන ලදැයි හෝ ඉටු කරන ලදැයි පරිකල්පිත බලතල හෝ කාර්ය, වලංගු ලෙස ක්‍රියාත්මක කර තිබුණු සහ ඉටුකර තිබුණු හා වලංගුව පවතින ඒවා ලෙස සලකනු ලැබිය යුතු ය.

*අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.*

10. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. විදේශීය) රු. 1,160 කි. කොළඹ 07, බෞද්ධාලෝක මාවත, අංක 255, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත පැමිණ වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන ඒ ඒ වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.